# ජාතික විද්‍යා පදනම - 2010

---------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

------------------

1.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ජාතික විද්‍යා පදනමේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ජාතික විද්‍යා පදනමේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

1.2.1 ගිණුම්කරණ අඩපාඩු

------------------------

රු.4,095,833 ක් වටිනා ප්‍රකාශන තොග ගිණුම් වලට ගෙන නොතිබුණි.

1.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසානයට විවිධ ණයගැතියන්ගේ ශේෂය රු.1,646,250 ක් වූ අතර, අයකර ගැනීමට ඇති අත්තිකාරම් ගිණුම්වල ශේෂය රු.98,195 ක් විය. විවිධ ණයගැතියන්ගෙන් රු. 1,576,469 ක මුදලක් අවුරුදු 1 කට අඩු කල් ගතවූ ණය වන අතර, අවුරුදු 1-5 ත් අතර, පැරණි ණයගැති ශේෂය රු. 69,780 ක් විය. තවද අවුරුදු 1-5 ත් අතර, කල් ඉකුත්වූ අත්තිකාරම් වටිනාකම රු. 65,995 ක් වන අතර, අවුරුදු 5 කට වඩා පැරණි අත්තිකාරම් ශේෂය රු. 30,000 ක් විය.

1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

එක් එක් විෂය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැතිවීම හේතුකොට ගෙන ගිණුම්වල වූ පහත සඳහන් විෂයයන් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය /සත්‍යාක්ෂණය කිරීමට හෝ විගණනයේදී පිළිගැනීමට නොහැකි විය

| විෂයය | වටිනාකම | නොසැපයූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉඩම් | 282,701,586 | ඉඩමේ හිමිකම් ඔප්පුව නොතිබීම. |
| ස්ථාවර වත්කම් (ගොඩනැගිලි හැර) | 85,502,354 | වටිනාකම දැක්වෙන උපලේඛන ඉදිරිපත් නොකිරීම. |
| තොග | 5,213,690 | භෞතික තොග සමීක්ෂණ වාර්තා |
| ණයහිමියෝ | 6,673,953 | අදාල පාර්ශ්වයන් විසින් ශේෂ සනාථ කිරීම් |
| උපකරණ ප්‍රදාන | 2,063,126 | ඉන්වෙන්ට්‍රි ලේඛනයේ සහතික කරන ලද පිටපතක් |
| ආයෝජන - නැන්කෝ සමාගම | 82,000,000 | කොටස් සහතික |

1.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | |
| (i) 9.4 ඡේදය | ජාතික විද්‍යා පදනමේ විද්‍යාත්මක නිලධාරියකු සාක් බලශක්ති මධ්‍යස්ථානය වෙත අමාත්‍ය මණ්ඩල අනුමැතිය නොමැතිව අවුරුදු 3 කට නිදහස් කර තිබුණි. |
| (ii) 9.10 ඡේදය | සේවකයන් 22 දෙනෙකු පැවරුම් පදනමට බඳවා ගැනීම සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (iii) 8.8 ඡේදය | මූල්‍ය බලතල පැවරුම් සෑම වසරකම ආරම්භයේ අධ්‍යක්ෂක මණ්ඩලය මගින් අනුමත කල යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2006 මාර්තු 1 දිනැති හා අංක 9 දරන ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 ජේදය | මිල සැදහුම් ක්‍රමය භාවිතා කළ හැක්කේ රු. මිලියන 2 ට වඩා අඩු භාණ්ඩ හා සෙවා ලබා ගැනීම වෙනුවෙන් වුවද ලෝක විද්‍යා දින උත්සවයේ වියදම වු රු.2,823,500 සඳහා මෙම ක්‍රමය යටතේ මිල ගණන් කැදවා තිබුණි. |
| (ඇ) | මුදල් රෙගුලාසි 371(2) | නිකුත් කල හැකි අග්‍රිමය රු.20,000 කට වැඩි නොවිය යුතු වුවත් නිරන්තරයෙන් ලඟ තබා ගන්නා රු.50,000 ක විශේෂ අග්‍රිමයක් නිකුත් කර තිබුණි. |
| (ඇ) | පර්යේෂණ ප්‍රදාන ගිවිසුම | 2003, 2005 කාලපරිච්ජේදයට අදාලව නිම කළ පර්යේෂණ ප්‍රදාන අතුරින් ලිපිගොනු 15 ක නියැදි පරික්ෂාවකදී ප්‍රදාන 08 ක් සඳහා අවසන් පර්යේෂණ වාර්තාව පර්යේෂණය නිමකල දින සට දින 90 ක් ඇතුලත ඉදිරිපත් කර නොතිබුණි. |

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය
--------------------------------------

2.1 මූල්‍ය සමාලෝචනය
----------------------

2.2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පදනමේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.4,721,202 ක අතිරික්තයක් වූ අතර ඉකුත් වර්ෂය සඳහා ඊට එරෙහි ඌනතාවය රු. 2,485,631 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල වල රු. 7,206,833 ක වැඩි වීමක් දක්නට ලැබුණි. මෙයට බලපෑ ප්‍රධාන හේතු වූයේ අඩමාන ණය සහ විගණන ගාස්තු වෙනුවෙන් පෙර වර්ෂවල කර තිබූ පිළිවෙලින් රු. 7,367,059 හා රු. 1,315,241 ක අධි වෙන්කිරිම් සමාලෝචිත වර්ෂයේ ආදායමට ගැනීම වේ.

2:2 මෙහෙයුම් සමාලෝචනය

2:2:1 කාර්ය සාධනය

| විෂයය | මුදල | නිරීක්ෂණ |
| --- | --- | --- |
| | රු. | |
| තේමා මූලික පරීක්ෂණ | - | ආහාර සුරක්ෂිතතාවය දේශගුණික විපර්යාසයන්, බලශක්ති සහ ජලය යන ප්‍රමුඛතා ක්ෂේත්‍ර 4 හඳුනාගෙන මෙම වැඩ සටහන 2009 වසර සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද 2010 දෙසැම්බර් 31 දක්වාත් මේ සඳහා අරමුදල් සපයා ගත නොහැකි වී තිබුණි. මෙය වසර කිහිපයක් අවශ්‍ය ව්‍යාපෘතියක් බව සභාපතිනිය දැනුම් දී තිබුණි. |
| නිමකල පර්යේෂණ | 21,181,124 | නිමකල පර්යේෂණ වෙනුවෙන් පර්යේෂණ පත්‍රිකා සහ අවසන් වාර්තා ඉදිරිපත්කර නොතිබුණි. |
| පර්යේෂණ ප්‍රදාන අරමුදල | 70,150,000 | පර්යේෂණ ප්‍රදාන සඳහා ලැබී තිබුණ මුදලින් නව පර්යේෂණ සඳහා රු.9,836,532 ක් පමණක් ලබා දී තිබුණි. භාණ්ඩාගාරයෙන් මුදල් ලැබුණේ වර්ෂයේ අවසන් කාර්තුවේ දී බැවින් මුළු මුදලම පර්යේෂණ සඳහා ලබාදීමට නොහැකි වූ බව ජාතික විද්‍යා පදනමේ අධ්‍යක්ෂ දන්වා තිබුණි. |
| ආරම්භ නොකල පර්යේෂණ | 2,248,554 | සමාලෝචිත වර්ෂය සඳහා අනුමත කරන ලද පර්යේෂණ 3 න් 1 ක් අහෝසි වී තිබූ අතර, 2 ක් ආරම්භ කර නොතිබුණි. |

2:2:2 කළමණාකරන අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිම කරන ලද පර්යේෂණ වලට අදාල වාර්තා ඇගයීම සඳහා දීර්ඝ කාලයක් ගත වී තිබුණි.

(ආ) පර්යේෂණවල ප්‍රතිඵලයක් ලෙස පේටන්ට් බලපත්‍ර ලබාගැනීමට අදාල පර්යේෂකයා සමඟ කටයුතු කර නොතිබුණි. පේටන්ට් අයිතිය ලබාගත හැකි වන්නේ පර්යේෂකයාට හා ඔහු වැඩ කරන ආයතනයට බව අධ්‍යක්ෂ විසින් දැනුම් දී ඇත.

2:2:3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නියමිත වේලාවට මූල්‍ය ප්‍රතිපාදන ලබා නොදීම හේතුවෙන් 2004 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ පර්යේෂණ ආයතන හා විශ්ව විද්‍යාල වලට ලබා දුන් රු.24,987,968 ක් වටිනා ප්‍රදානයන් 27 ක ව්‍යාපෘති නිම කල යුතු කාලය අවසන් වී තිබුණද එම පර්යේෂණවල ව්‍යාපෘති වාර්තා සමාලෝචිත වර්ෂය අවසාන වනතුරුත් ජාතික විද්‍යා පදනම වෙත ලැබී නොතිබුණි.

(ආ) පර්යේෂණ ප්‍රදාන යටතේ ලබා දී ඇති රු.922,000 ක් වටිනා ශිෂ්‍යත්ව තුනක් අසනීප, රටහැරයෑම ආදී කරුණු යටතේ නවතා තිබුණි.

2:2:4 හඳුනාගත් පාඩු

------------------

ආරක්ෂක නිලධාරීන්ගේ නොසැලකිලිමත්භාවය නිසා විද්‍යා පදනමට අයත් වටිනාකම ගණනය කර නොතිබුණු ජාතික කොඩි, ජ්අයි පයිප්ප, සම්මන්ත්‍රණ මේස, ආපන ශාලාවේ උපකරණ හා අකුණු සන්නායක පද්ධතිය නැති වී තිබුණි.

2:2:5 හඳුනානොගත් ශේෂ

------------------------

රු. 7,960,931 ක් වටිනා විද්‍යාත්මක පර්යේෂණ උපකරණ විශ්ව විද්‍යාල හා අනෙකුත් පර්යේෂණ ආයතනවලට පවරා දී තිබුණද එම පැවරීම් හඳුනාගෙන ගිණුම් වල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

3. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාපතිනියගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

(අ) බඳවා ගැනීම්

(ආ) තොග පාලනය

(ඇ) ගිණුම්කරණය

(ඉ) සේවා සපයා ගැනීම